**ශීර්ෂය 158 - රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 158 - රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 15 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

-------

### 2.1 විසර්ජන ගිණුම්

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 1,206.8 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,189.9 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 16.9 ක් හෙවත් සියයට 1.4 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 24.93 | 17.60 | 7.33 | 29.40 |
| මූලධන | 1,181.96 | 1,172.30 | 9.66 | 0.82 |
| **එකතුව** | **1,206.89** | **1,189.90** | **16.99** | **1.41** |

**2.2** **අත්තිකාරම් ගිණුම**

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 15801 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු. මිලියන** | **රු. මිලියන** | **රු.මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| 3.00 | 0 | 0.02 | 0.11 | 20.00 | 4.39 |

2.3 **අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශ යේ අංක 7002/0000/00/0453/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 1.50 ක් වී තිබුණි.

2.4 **විගණන නිරීක්ෂණය**

අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. මෙම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3.** **ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1** **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

| ලේඛන වර්ගය | | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | ලැබෙන චෙක්පත් හා මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය | මුදල් රෙගුලාසි 451 |
| (ඈ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| (ඉ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| (ඊ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය |

**3.2 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

වැය විෂයයන් 9 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 2.08 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

**3.3 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 15801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය විගණනයට ඉදිරිපත් කර තිබුණි. එම ප්‍රකාශයේ වූ ණය හා අත්තිකාරම් ශේෂ දැක්වෙන ලේඛනය 1994 අගෝස්තු 10 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වර්ෂය සඳහා වූ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි.

**3.5** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**--------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 19 | 08 | 11 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 01 | 02 |
| (iii) | ද්විතීයික මට්ටම | 32 | 19 | 13 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 30 | 12 | 18 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත්) | 04 | 01 | 03 |
| | **එකතුව** | **88** | **41** | **47** |

.